# විෂයමාලා ආවරණය සඳහා යෝජිත වැඩසටහන

## පළමුවන ශ්‍රේණිය (පළමුවන වාරය)

**2022**

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## යෝජිත වැඩසටහන සඳහා උපදෙස් මාලාව

2022 පාසල් වර්ෂය සඳහා පාසල්වල දෛනික පරිපාලන කටයුතු හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව සාමාන්‍ය පරිදි පවත්වා ගැනීම උදෙසා කඩිනම් පියවර ගැනීමට සිදු වී තිබේ.

ඒ අනුව මෙම අධ්‍යයන වර්ෂය තුළ දී  අනිවාර්යයෙන් ම අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත හඳුනා ගෙන ඊට අනුව කාලය වෙන් කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මෙමගින් අපේක්ෂිත ය.

ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපන අවධියේ එක් එක් ශ්‍රේණිවල පළමුවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් අන්තර්ගතවලින් අත්‍යවශ්‍ය ඉගෙනුම් කොටස් පමණක් මෙමගින් ඉදිරිපත් කරනු ලබයි. මෙම විෂය කොටස් සාධනය වූ විට දෙවන වාරයට අවශ්‍ය ඉගෙනුම් අවස්ථා සඳහා සුදුසුකම් ලබන බව වැඩිදුරටත් සඳහන් කරමු.

එමෙන් ම දැනටමත් පළමුවන වාරයට අදාළ යම් පමණක විෂය කොටස් ප්‍රමාණයක් ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විවිධතාවලින් යුතු ව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වී ඇත. එසේ වුවද අප විසින් යෝජනා කරනු ලබන්නේ පළමුවන වාරයට අදාළ ව සිසුන් විසින් අත්‍යවශ්‍යයෙන් ම අත්පත් කරගත යුතු විෂය කොටස් ය. මෙම යෝජිත විෂය කොටස්වලින් ද ඔබ පාසලේ ආවරණය වූ විවිධ විෂයය කොටස් තිබිය හැකි ය. එසේ වූ විට දී එම කොටස් අතහැර ඊළඟට ඇති විෂයය කොටසේ සිට පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමට අප විසින් යෝජනා කරන්නෙමු.

එමෙන් ම එක් එක් විෂය අන්තර්ගත සඳහා යෝජිත කාලය ඔබ පන්ති කාමරයේ සිටින සිසුන්ගේ සාධනය මත නම්‍යශීලී ව හා සාධාරණ ව වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත. එනමුත් යෝජිත විෂය අන්තර්ගතවලින් අඩු නොකොට ඒ සියල්ල මනා ලෙස සම්පූර්ණ කිරීමේ වගකීම ද ඔබ සතු ය.

එක් එක් විෂය සඳහා ගුරුමාර්ගෝපදේශයට අනුව පළමුවන වාරයට නිර්දිෂ්ට විෂය අන්තර්ගත මාර්ගගත ක්‍රමයට හෝ ඉතාමත් සරල පැහැදිලි කිරීම්වලින් අනතුරු ව නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් ලෙසට හෝ ආවරණය කළ හැකි ය. එසේ වුවත් නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දෙන ක්‍රියාකාරකම් සිසුන්ට අනවශ්‍ය බරක්, පීඩනයක් නොවන ආකාරයට ලබා දීම ද ඔබ සතු වගකීමකි.

එමෙන් ම අප විසින් යෝජනා කරනු ලබන අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත ඒ ඒ විෂය තක්සේරුවට අනුව විධිමත් ලෙස තක්සේරු කිරීම ඔබ සතු වගකීමකි. මීට අමතර ව මාර්ගගත ක්‍රමයට සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමයට ආවරණය කරනු ලබන විෂය කොටස්වලට අදාළ ව සිසුන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් නැවත පන්ති කාමරයට ගෙන්වා ගත යුතු ය. අනතුරු ව ඒවා සිසුන් ඉදිරියේ පරීක්ෂා කර අවශ්‍ය ප්‍රතිපෝෂණ සහ ඉදිරිපෝෂණ ලබා දී විෂය තක්සේරුවට අනුව තක්සේරු කිරීම ද සිදු කළ යුතු ය.

ඒ අනුව සෑම විෂයයක ම අදාළ වාරයට අපේක්ෂිත ඉගෙනුම් පල කරා සියලු ම සිසුන් ළඟා කරවීම ඔබ සතු වගකීමකි. කෙසේ වුවත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන් සෞඛ්‍ය සම්පන්න ව, ආරක්ෂිත ව, ප්‍රීතිමත් ව සහ ක්‍රියාශීලී ව ඒ සඳහා යොමු කරලීමේ වගකීම ද ඔබ සතු ය. ඒ අනුව ශ්‍රී ලාංකේය ප්‍රාථමික අධ්‍යාපනය හදාරන සිසුන්ගේ ඉගෙනුම් කාර්යය ශක්තිමත් හා ඵලදායී කරලීමේ උතුම් අරමුණින් මේ සියල්ල ක්‍රියාත්මක කිරීමට ඔබට ශක්තිය ලැබේවා යි පතමු.

**මව්බස - සිංහල**
**පළමුවන ශ්‍රේණිය (පළමුවන වාරය)**

පළමුවන ශ්‍රේණියේ පළමුවන වාරය සඳහා ආවරණය කළ යුතු අත්‍යවශ්‍ය ම විෂය අන්තර්ගත පහත පරිදි යෝජනා කෙරෙයි. ඒ අනුව දී ඇති අනුක්‍රමයට අදාළ ව ඉගෙනුම් පල සාධනයට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කළ යුතු ය.

ඒ අනුව R 1 W 1 යන පළමුවන නිපුණතාවට අදාළ එක් එක් ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ දී සිදු කරමින් ඒවා තව දුරටත් නැවත පුහුණු වීමේ අභ්‍යාස ලෙස නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දීම සිදු කළ හැකි ය. එමෙන් ම පළමුවන ශ්‍රේණියේ වැඩ පොතෙහි අකුරු ලිවීමට අදාළ අභ්‍යාස ද මේ සඳහා යොදා ගන්න.

## පළමුවන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | $L_1$ අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි.<br><br>$S_1$ අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි. | ▪ පවසන දේ අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි. | ▪ පවසන දෙයට සවන් දීම.<br>▪ පින්තූර බලා පවසන දෙයට සවන් දීම.<br>▪ නිදහසේ කතා කිරීම.<br>▪ පින්තූර බලා කතා කිරීම. | ක්‍රියාකාරකම 1 | 33 | පැය 01 |
| | | | | ක්‍රියාකාරකම 2 | 33 | පැය 01 |
| | | | | ක්‍රියාකාරකම 5 | 34 | පැය 01 |
| | | | | ක්‍රියාකාරකම 6 | 35 | පැය 01 |

## පළමුවන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | $R_1$<br>කියවීමේ යාන්ත්‍රණය අනුගමය කරමින් කියවයි.<br><br>$W_1$ සම්මත නිවැරදි ක්‍රමයට ලියයි. | ■ ශබ්ද විභේදන හඳුනා ගෙන අකුරු, වචන, වාක්‍යාංශ හා වැකි උච්චාරණය කරයි.<br><br>■ අකුරු, වචනවල විවිධතා හඳුනා ගෙන නිවැරදි ව ලියයි. | ■ පිලි රහිත අකුරු කියවීම<br><br>■ පිලි රහිත අකුරු එකතු කර වචන කියවීම.<br><br>■ පිලි රහිත සරල වාක්‍යාංශ කියවීම.<br><br>■ පිලි රහිත අකුරු ලිවීම.<br><br>■ පිලි රහිත අකුරු එකතු කර වචන ලිවීම.<br><br>■ පිලි රහිත සරල වාක්‍යාංශ කියවීම හා ලිවීම. | ක්‍රියාකාරකම 02<br>i) අකුරු හඳුන්වා දීම<br><br>i) මධ්‍ය අක්ෂර 09<br>(ග, හ, ය, ස, ප, න, ත, ක, ග)<br>■ පස්රුලේ සහ තනිරුලේ ලිවීම | 37<br>සිට<br>39<br>දක්වා | පැය 15 |
| | | | | ■ පිලි රහිත වචන කියවීම හා ලිවීම | | පැය 06 |
| | | | | ■ පිලි රහිත වචන සිංහල කියවීම් පොතෙන් සොයා කියවීම හා ලිවීම | | පැය 06 |
| | | | | ■ පිලි රහිත වචන යෙදුණු වාක්‍යාංශ කියවීම හා ලිවීම | 40 | පැය 04 |
| | | | | | මුළු කාලය | පැය 35 |

**ගණිතය**

**පළමුවන ශ්‍රේණිය (පළමුවන වාරය)**

ගණිතය විෂයමාලාවේ පළමුවන ශ්‍රේණියේ පළමු වාරයට අදාළ අත්‍යවශ්‍ය ම ඉගෙනුම් සංකල්ප සාධනය සඳහා අවශ්‍ය විෂය අන්තර්ගතය මෙහි ඇතුළත් කර ඇත. සිසුන් පීඩනයට පත් නොවන අයුරින් ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා මෙය උදවු කර ගත හැකි ය. මෙහි යෝජනා කර ඇති කාලය උචිත පරිදි ගළපා ගනිමින් ගුරු මාර්ගෝපදේශයේ දක්වා ඇති මගපෙන්වීම් ද ප්‍රයෝජනයට ගෙන ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්කරගෙන ඇති ද යන්න තහවුරු කරගන්න. ක්‍රියාකාරකම්වලට උචිත අයුරින් ගණිතය වැඩ පොත සඳහා ද සිසුන් යොමු කරන්න. සමහර නිපුණතාවලට අදාළ ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ සිදු කිරීමෙන් පසු ව එම සංකල්ප තව දුරටත් තහවුරු කිරීම සඳහා නිවෙස් පාදක ක්‍රමය ඔස්සේ අභ්‍යාස ලබා දිය හැකි ය.

## පළමුවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 1. ද්‍රව්‍ය කට්ටලයක් වරකට එක් උපලක්ෂණයක් අනුව ගොඩවලට වෙන් කර වෙන් කළ ආකාරය ප්‍රකාශ කරයි. | 1.1 ද්‍රව්‍ය කට්ටලයක් වර්ගය අනුව ගොඩවලට වෙන් කර වෙන් කළ ආකාරය ප්‍රකාශ කරයි.<br><br>1.2 විවිධ වර්ණයෙන් යුත් ද්‍රව්‍ය කට්ටලයක් වර්ණය අනුව ගොඩවලට වෙන් කරයි.<br><br>1.3 විවිධ හැඩයෙන් යුත් ද්‍රව්‍ය කට්ටලයක් හැඩය අනුව ගොඩවලට වෙන් කරයි.<br><br>1.4 ද්‍රව්‍ය කට්ටලයක් තරම අනුව ගොඩවලට වෙන් කරයි. | ▪ ද්‍රව්‍ය වර්ගය අනුව තේරීම<br><br>▪ වර්ණය අනුව තේරීම<br><br>▪ හැඩය අනුව තේරීම<br><br>▪ තරම අනුව තේරීම | පාඩම 01:<br>ක්‍රියාකාරකම 1 සිට 4 | 3 සිට 4 | පැය 03 මි.30 |
| | 2. ද්‍රව්‍ය හෝ ද්‍රව හෝ ප්‍රමාණ දෙකක් සසඳයි. | 2.1 ද්‍රව්‍ය ප්‍රමාණ දෙකක් සමාන/අඩු/වැඩි ලෙස සසඳයි.<br><br>2.2 ද්‍රව ප්‍රමාණ දෙකක් සමාන/අඩු/වැඩි ලෙස සසඳයි. | ▪ ද්‍රව්‍ය සහ ද්‍රව ප්‍රමාණ සමාන/අඩු/වැඩි ලෙස සැසඳීම. | පාඩම 02:<br>ක්‍රියාකාරකම 3 සිට 4 | 6 සිට 7 | පැය 01 |

## පළමුවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 3. ද්‍රව්‍ය/රූප කට්ටල දෙකක් එකට එක ගළපයි. | 3.1 නිතැතින් ම ගැළපෙන ද්‍රව්‍ය/රූප කට්ටල දෙකක් එකට එක අනුරූප ව ගළපා සන්සන්දනය කරයි.<br><br>3.2 එකිනෙකට නොගැළපෙන ද්‍රව්‍ය/රූප කට්ටල දෙකක් එකට එක අනුරූප ව ගළපා සන්සන්දනය කරයි. | ■ එකට එක අනුරූප ව ගැළපීම | පාඩම 03:<br>ක්‍රියාකාරකම 1<br>පාඩම 04:<br>ක්‍රියාකාරකම 2 සිට 4 | 08<br><br>10 සහ 11 | පැය 01 මි.30 |
| | 4. ආකෘති/රූප තුනක සාපේක්ෂ පිහිටීම විස්තර කරයි. | 4.1 එක ම දිශාවට යොමු වූ ආකෘති තුනක සාපේක්ෂ පිහිටීම විස්තර කරයි.<br><br>4.2 රූප තුනක් ඇසුරෙන් සාපේක්ෂ පිහිටීම විස්තර කරයි. | ■ ආකෘතිවල සාපේක්ෂ පිහිටීම<br><br>■ රූපවල සාපේක්ෂ පිහිටීම | පාඩම 05:<br>ක්‍රියාකාරකම 1 සිට 3 | 12 සහ 13 | පැය 01 මි.30 |
| | 5. එක ම හැඩයේ එක ම වර්ගයේ ද්‍රව්‍ය තරම අනුව පටිපාටිගත කරයි. | 5.1 එක ම හැඩයේ එක ම වර්ගයේ ද්‍රව්‍ය තුනක් තරම අනුව පටිපාටිගත කරයි. | ■ තරම අනුව පටිපාටිගත කිරීම | පාඩම 06:<br>ක්‍රියාකාරකම 1 සහ 2 | 14 සහ 15 | පැය 02 |

පළමුවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 6. 1 සිට 3 තෙක් සංඛ්‍යා හඳුනා ගෙන භාවිත කරයි. | 6.1 1 සිට 3 තෙක් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් කියයි.<br><br>6.2 1 සිට 3 තෙක් සංඛ්‍යා ද්‍රව්‍ය/රූප ඇසුරෙන් නිරූපණය කරයි.<br><br>6.3 1 සිට 3 තෙක් සංඛ්‍යාංක කියවයි, ලියයි. | ▪ 1 සිට 3 තෙක් සංඛ්‍යා හඳුනා ගැනීම.<br>▪ 1 සිට 3 තෙක් සංඛ්‍යාංක කියවීම සහ ලිවීම. | පාඩම 08 සහ 09:<br>සියලු ම ක්‍රියාකාරකම් | 18 සිට 22 | පැය 07 |
| | 7. වස්තු දෙකක/ පුද්ගලයින් දෙදෙනෙකුගේ උස සසඳයි. | 7.1 වස්තුවල උස විස්තර කිරීම සඳහා උස සහ මිටි යන වචන නිවැරදි ව භාවිත කරයි.<br><br>7.2 උස වැඩි, උස අඩු හා උස සමාන ලෙස වස්තුවල උස සසඳයි.<br><br>7.3 වස්තුවල උස සන්සන්දනය කිරීම සඳහා තම සිරුර මිනුම් ඒකකයක් ලෙස භාවිත කරයි. | ▪ වස්තුවල උස සැසඳීම<br>▪ පුද්ගලයින්ගේ උස සැසඳීම | පාඩම 11:<br>සියලු ම ක්‍රියාකාරකම් | 24, 25 | පැය 03 මි.30 |

පළමුවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 8. පරිසරයේ වස්තුවල ඇති විවිධ හැඩ හඳුනා ගනියි. | 8.1 හැඩය අනුව ශාක පත්‍ර ගොඩවලට වෙන් කරයි.<br>8.2 හැඩය අනුව ඝන වස්තු ගොඩවලට වෙන් කරයි.<br>8.3 පරිසරයේ ඇති විවිධ වස්තුවල හැඩ පිළිබඳ ව විස්තර කරයි. | ▪ පරිසරයේ වස්තුවල ඇති විවිධ හැඩ හඳුනා ගැනීම.<br>▪ ලක්ෂණ හඳුනා ගැනීම. | පාඩම 07 සියලු ම ක්‍රියාකාරකම් | 16 සහ 17 | පැය 03 මි.30 |
| | 9. ද්‍රව භාවිතයෙන් අචලතාව හඳුනා ගනියි. | 9.1 භාජනයේ හැඩය වෙනස් වුව ද එක ම ද්‍රව ප්‍රමාණයක පරිමාව (ප්‍රමාණය) වෙනස් නොවන බව හඳුනා ගනියි. | ▪ ද්‍රවයක අචලතාව | පාඩම 10: ක්‍රියාකාරකම 01 සහ 02 | 23 | පැය 01 |
| මුළු කාලය | | | | | | පැය 24 මි.30 |

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
## පළමුවන ශ්‍රේණිය (පළමුවන වාරය)

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ පළමුවන ශ්‍රේණියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතය මෙහි දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී පරිසර ගවේෂණය, විද්‍යාත්මක සංකල්ප භාවිතය සිසුන් සමග සිදු කළ යුතු අතර මෙහි සඳහන් අනෙකුත් ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් විශේෂයෙන් සෞන්දර්ය, ක්‍රීඩා හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් නිවෙස පාදක ව සිදු කිරීමට ද සිසුන් යොමු කළ යුතු ය. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලට අදාළ කවි, ගීත ආදියෙහි අර්ථය ගායනයට පෙර සිසුන්ට පැහැදිලි කරමින් ඊට අදාළ ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

චිත්‍ර ඇඳීමේ දී, ඇඹීමේ දී, ආකෘති ගොඩනැගීමේ දී සිසුන්ගේ ඇති දක්ෂතාවලින් ම සිය නිර්මාණ එළිදැක්වීමටත් ඒවා අගය කරමින් ඔවුන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කිරීමටත් උත්සුක විය යුතු ය. නිවෙස් පාදක ව ක්‍රියාකාරකම් සිදු කරන සෑම අවස්ථාවක දී ම සිසුන්ගේ හැකියා වර්ධනය වන පරිදි ඊට අදාළ ක්‍රියාකාරකම් ඔවුන් විසින් ම කිරීම සඳහා යොමු කළ යුතු ය. සිසු නිර්මාණ පාසලට පැමිණෙන දිනයන්හි රැගෙන ඒමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ගන්න. කණ්ඩායම් ලෙස හෝ තනි තනි ව ප්‍රදර්ශනය කිරීමටත් ඒවා අගය කිරීමටත් කටයුතු කරන්න.

සිසුන් තුළ යහපත් ආකල්ප ඉස්මතු වන ආකාරයට සෑම ක්‍රියාකාරකමක් ම ගොඩනගා ගන්න. **ආදරය, කරුණාව, දයාව වැනි සංවර්ධනාත්මක චිත්තවේග දියුණු කිරීමටත්** ක්ෂේන්තිය, හිංසාව, රිදවීම වැනි අහිතකර චිත්තවේග පාලනය කිරීමටත් සෑම ක්‍රියාකාරකමකින් ම සමාජ හිතවාදී චර්යා ඉස්මතු කිරීමටත් වග බලා ගන්න.

**අන්මත ඉවසීම, අන් අයට ගරු කිරීම, නායකත්වයට ගරු කිරීම, සාමූහික ව කටයුතු කිරීම** ආදී සමාජ කුසලතා වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් තව දුරටත් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමු.

ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයයට අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී ගුරු මාර්ගෝපදේශයේ දෙන ලද උපදෙස් අනුව කටයුතු කරන්න. ගීතවලට සහ වචනවලට අදාළ ශ්‍රව්‍ය පට (Audio materials) www.nie.lk - Downloads - other materials - English - ABOE මගින් ලබා ගන්න.

පළමුවන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| ■ පාසල් පරිසරය තුළ ආචාරශීලී ව කටයුතු කරයි. | 1 අපේ පාසල | ■ පාසල් පරිසරයට අනුගත ව කටයුතු කරයි. | ■ පාසලේ ක්‍රියාත්මක වන නීතිරීතිවලට අනුව කටයුතු කරයි.<br>■ පාසල් ගීතයට ගරු කරමින් එය නිවැරදි ව ගායනා කරයි.<br>■ පාසල් කොඩියට ගරුත්වයෙන් කටයුතු කරයි.<br>■ පාසල තුළ සිටින විවිධ පුද්ගලයින් සහ ඔවුන්ගේ භූමිකා විස්තර කරයි.<br>ABOE - Song Bits of Paper<br>ABOE - Words & Colour<br>■ ඉංග්‍රීසි භාෂාවෙන් නම විමසයි.<br>■ තමාගේ නම ඉංග්‍රීසි භාෂාවෙන් පවසයි. (What's your name? / I'm .......) | 03<br>04<br>05<br>06<br>Song Book Gr 1<br>Activity Book Gr 1 | 119 සහ 120<br>SB - 03<br>AB - 02<br>03 | පැය 04 |
| | 2 අපේ ගෙදර | ■ තම යුතුකම් හා වගකීම් ඉටු කරමින් නිවස යහපත් ලෙස පවත්වා ගෙන යාමට දායක වෙයි. | ■ නිවසේ දියුණුවට හැකි පමණින් උදවු කරයි.<br>ABOE - Song This is My House<br>ABOE - Words & Colour | 03<br>04<br>Song Book Gr 1<br>Activity Book Gr 1 | 123<br>05<br>04 - 11 | පැය 02 |
| ■ සියුම් ව නිරීක්ෂණය කර වෙනස්කම් ප්‍රකාශ කරයි. | 3 වත්තට එන සත්තු | ■ අවට පරිසරයේ වෙසෙන සතුන් අතර පවත්නා විවිධත්වය අධ්‍යයනය කර වාර්තා කරයි.<br>■ සතුන් ද පරිසරයේ කොටසක් සේ සලකා සංවේදී ව කටයුතු කරයි. | ■ සතුන්ගේ විවිධ ලක්ෂණ නිරීක්ෂණය කර ඉදිරිපත් කරයි.<br>■ සතුන්ගේ වාසස්ථාන නිරීක්ෂණය කර වාර්තා කරයි.<br>■ සතුන් කෙරෙහි සංවේදී බවින් යුතු හැසිරීම් ප්‍රදර්ශනය කරයි.<br>ABOE - Song In my Garden...<br>ABOE - Words & Colour | 01<br>02<br>03 - 04<br>Song Book Gr 1<br>Activity Book Gr 1 | 125<br>126<br>06<br>12 - 15 | පැය 09 |

## පළමුවන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| ■ සියුම් ව නිරීක්ෂණය කර වෙනස්කම් ප්‍රකාශ කරයි.<br>■ ද්‍රව්‍ය හා උපකරණ සැලකිලිමත් ව පරිහරණය කරයි. | 4 ජලය සමඟ සෙල්ලම් | ■ ජලය වටිනා සම්පතක් ලෙස සලකා ඵලදායී ව භාවිත කරයි.<br>■ ජලයේ ස්වභාවය සහ ද්‍රව්‍ය ජලය සමඟ හැසිරෙන ආකාරය පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි. | ■ ජලය නොමැති වීම නිසා ඇති විය හැකි දුෂ්කරතා පැහැදිලි කරයි.<br>■ යොදා ගන්නා භාජනය අනුව ජලයේ හැඩය වෙනස් කළ හැකි දැයි සොයා බලයි.<br>■ ජලය විවිධ ස්වරූපයන්ට අනුව වෙනස් වන ආකාරය පරීක්ෂා කර වාර්තා කරයි.<br>■ විවිධ ද්‍රව්‍ය ජලයට දැමූ විට පාවෙන ගිලෙන දෑ වෙන් කොට දක්වයි.<br>■ වර්ණ දියර යොදා ගනිමින් විවිධ නිර්මාණ කරයි.<br>ABOE - Song All in the Water... | 01<br>02<br>04<br>05<br>06<br>07<br>08<br>Song Book Gr 1<br>Activity Book Gr 1 | 129<br>130<br>131<br>132<br>07<br>16 සහ 17 | පැය 12 |
| | 5 අවුරුදු කාලය | ■ අවුරුදු කාලයේ දී වටපිටාවේ සිදු වන වෙනස්කම් ගවේෂණය කර වාර්තා කරයි.<br>■ චාරිත්‍ර වාරිත්‍රවල වැදගත්කම අගය කරමින් කටයුතු කරයි. | ■ අවුරුදු කාලයේ දී වටපිටාවේ සිදු වන වෙනස්කම් විස්තර කරයි.<br>■ අවුරුදු සමයේ සිදු කරන සිරිත් විරිත් හඳුනා ගනිමින් ඒවා අනුගමනය කරයි.<br>ABOE - Song Milk Rice .... | 01<br>02<br>03<br>Song Book Gr 1<br>Activity Book Gr 1 | 133<br>134<br>10<br>18 සහ 19 | පැය 08 |
| | | | | | මුළු කාලය | පැය 35 |

පළමුවන ශ්‍රේණිය - දෙවන ජාතික භාෂාව

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය පැය |
|---|---|---|---|---|
| තමාගේ නම නිවැරදි ව හා සුහද ව ප්‍රකාශ කරයි. | நான் .......... / නාන් ................ (මම ...............)<br><br>எனது பெயர் ........... / එනදු පෙයර් ............. (මගේ නම .............) | 1 සිට 4 | 192 | පැය 01 |
| ආචාරශීලී ව හා සුහද ව තම පන්තියේ මිතුරන්ගෙන් ඉල්ලීම් කරයි. | எடுங்கள் එඩුංගළ් (ගන්න)<br>தாருங்கள் තාරුංගළ් (දෙන්න)<br>போங்கள் පෝංගළ් (යන්න)<br>வாருங்கள் වාරුංගළ් (එන්න)<br>சொல்லுங்கள் සොල්ලුංගළ් (කියන්න)<br>பாடுங்கள் පාඩුංගළ් (ගයන්න)<br>பாருங்கள் පාරුංගළ් (බලන්න)<br>எழுதுங்கள் එළුදුංගළ් (ලියන්න)<br>சிரியுங்கள் සිරියුංගළ් (හිනාවෙන්න) | 1 සිට 6 | 193<br>194 | පැය 02<br>මි.30 |
| | | | මුළු කාලය | පැය 03<br>මි.30 |

පළමුවන ශ්‍රේණිය - බුද්ධ ධර්මය

| තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| 1 | ■ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හැඳින ගෙන චරිතායනය කරයි. | ■ සෝපාක කතා පුවත ඇසුරෙන් බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය විස්තර කරයි.<br><br>■ අනේපිඬු සිටු මිණිබිරියගේ කතා පුවත භාවිත කර බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය පැහැදිලි කරයි. | ■ සෝපාක පොඩි හාමුදුරුවෝ<br>■ අනේපිඬු සිටු මිණිබිරියගේ ශෝකය | පියවර 1, 2<br><br>පෙළ පොතේ<br>5, 15 පාඩම්<br>5. සෝපාක පොඩි පුතා<br>15. සෙල්ලම් බෝනික්කා | 3<br><br><br><br>6,7<br><br>31, 32 | පැය 02 මි.30 |

# පළමුවන ශ්‍රේණිය - බුද්ධ ධර්මය

| තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| 2 | ▪ සුවිශේෂ බෞද්ධ චරිත හා ජාතක කතා හැඳින ආදර්ශයට ගෙන කටයුතු කරයි. | ▪ රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන් අනතිමානී ගුණය ඉස්මතු වන අවස්ථා කිහිපයක් විස්තර කරයි.<br>▪ මිහිඳු මහරහතන් වහන්සේගේ වැඩම වීම නිසා ලක්දිවට බුදු දහම ලැබුණු බව ප්‍රකාශ කරයි.<br>▪ බුදු දහම වැළඳ ගැනීම නිසා දේවානම්පියතිස්ස රජතුමා සත්ව හිංසාවෙන් වැළකුණ බව පිළිගනිමින් කතා කරයි. | ▪ රාහුල පොඩි හාමුදුරුවෝ<br>▪ දේවානම්පිය තිස්ස රජතුමා | පියවර 1, 2<br>පෙළ පොතේ 6 පාඩම<br>පියවර 3<br>පෙළ පොතේ 7 පාඩම | 5<br>8,9<br>6<br>11, 12 | පැය 02 මි.30 |
| | | ▪ සාම කුමරුගේ චරිතයේ ගුණාංග ඉස්මතු කරමින් කතාව ගොඩනගයි.<br>▪ සාම කුමාරයාගේ චරිතය ආදර්ශයට ගෙන දෙමව්පියන්ට උදවු කළ හැකි ආකාරය ප්‍රකාශ කරයි. | ▪ සාම ජාතකය | පියවර 1, 2, 3<br>පෙළ පොතේ 8 පාඩම<br>මෙත් වඩමු ජය ලබමු. | 6<br>13,14 | පැය 01 මි.15 |

## පළමුවන ශ්‍රේණිය - බුද්ධ ධර්මය

| තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| 3 | ▪ බෞද්ධ දරුවකුගේ අනන්‍යතාවය තම චරිතයෙන් ප්‍රදර්ශනය කරයි. | ▪ දෙමව්පියන්ට, ගුරුවරුන්ට හා වැඩිහිටියන්ට ගරු කළ හැකි ආකාරය විස්තර කරයි.<br><br>▪ පාසලට පැමිණීමට පෙර හා රාත්‍රී නින්දට පෙර දෙමව්පියන් නැමදිය යුතු බව පිළිගනිමින් කතා කරයි. | ▪ ගුරුවරුන් නැමදීම<br>▪ දෙමව්පියන් නැමදීම | පියවර 7<br>පියවර 8<br>17 පාඩම<br>උතුම් මව්පියෝ<br><br>පියවර 9<br>18 පාඩම<br>දියුණුවේ මග ගුරුවරු | 09<br><br><br>34, 35<br><br><br>36, 37 | පැය 01 මි.15<br><br><br><br>පැය 01 මි.15 |
| | | | | | මුළු කාලය | පැය 08 මි.45 |

පළමුවන ශ්‍රේණිය - කතෝලික ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | | ▪ ගුරුවරුන්ට , අසල්වැසියන්ට<br>▪ සහ මිතුරු මිතුරියන්ට ආදරය කරයි. උපකාර කරයි. | ▪ ගුරුවරුන්, අසල්වැසියන් හා මිතුරු මිතුරියන් | පියවර 1,2<br>පෙළ පොතේ<br>4 පාඩම<br>දේව ආදරය තුළින් අපට ලැබුණු තවත් අය<br>24 පිටුව ක්‍රියාකාරකම | 7 | පැය 01<br>මි.15 |
| | | ▪ මහෝත්තම දෙවි පියාණන් වහන්සේගෙන් අප ලද ලස්සන ලෝකය වර්ධනය කිරීම සඳහා පාසල් භූමිය පිරිසිදු කර පැළ සිටුවා අලංකාර කරයි. | ▪ ගස්වැල්, මල්, සුරතල් සතුන් හා කුරුල්ලන් ඇතුළු මහෝත්තම දෙවි පියාණන් දුන් ලස්සන ලෝකයට ආදරය කිරීම හා එය සුරැකීම. | පියවර 1,2<br>පෙළ පොතේ<br>5 පාඩම<br>දෙවිඳුන් මැවූ ලස්සන ලෝකය රැක ගනිමු.<br>25 පිටුව<br>ක්‍රියාකාරකම | 8, 9 | පැය 01<br>මි.15 |
| | | ▪ උත්තරීතර ජේසුස් වහන්සේ අපට ඇති ආදරය නිසා දුක් විඳ, මරණයට පත්ව උත්ථාන වූ බව ප්‍රකාශ කරයි.<br>▪ උත්තරීතර ජේසුස් වහන්සේට ඇති ආදරය පෙන්වීමට ආත්මික මල් පොකුරක් සකස් කරයි. | ▪ කුරුසියේ මරණයට පත්වූ උත්තරීතර ජේසුස් වහන්සේ. | පියවර 1,2,3<br>පෙළ පොතේ 14 පාඩම<br>කුරුසිය ජය ගත් ජේසුස් වහන්සේ<br>34 පිටුව ක්‍රියාකාරකම | 20 | පැය 01<br>මි.15 |

## පළමුවන ශ්‍රේණිය - කතෝලික ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කරයි. | ■ දේවස්ථානය නරඹයි.<br>■ නිවැරදි ඉරියවුවෙන් මහෝත්තම දෙවි පියාණන් වහන්සේට නමස්කාර කර සුළු යාච්ඤාවක් කියයි.<br>■ වන්දනා ඉරියවු නිවැරදි ව පෙන්නුම් කරමින් වන්දනාවේ ගීතිකාවක් ගායනා කරයි. | ■ හිස පහත් කිරීම, දණ ගැසීම, වැඳීම යන වන්දනා ඉරියවු. | පියවර 1,2<br>පෙළ පොතේ 6 පාඩම<br>කිතුණු දරුවා හොඳ ළමයෙකි.<br>26 පිටුව ක්‍රියාකාරකම | 10 | පැය 01 මි.15 |
| | | ■ සැම යාච්ඤාවකට ම පෙර සාන්ත කුරුසය ලකුණ නිවැරදි ව උච්චාරණය කරමින් සලකුණු කරයි. | ■ සාන්ත කුරුසය ලකුණ සලකුණු කිරීම, ශුද්ධ වූ ත්‍රිත්වය<br>■ සාන්ත කුරුසය යාච්ඤාව ඇතුළත් මූලික යැදුම්. | පියවර 1, 2<br>පෙළ පොතේ 7 පාඩම<br>මහෝත්තම දෙවි පියාණන් වහන්සේට කතා කරමු.<br>27 පිටුව ක්‍රියාකාරකම<br><br>පියවර 1,2<br>පෙළ පොතේ 8 පාඩම<br>සාන්ත කුරුසිය<br>28 පිටුව ක්‍රියාකාරකම | 11 | පැය 01 මි.15 |

පළමුවන ශ්‍රේණිය - කතෝලික ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | ▪ මහෝත්තම දෙවියන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි. | ▪ ප්‍රසාද ස්නාපනයෙන් දේව දරුවකු වන බව විස්තර කරයි.<br>▪ දේව දරුවා ස්වර්ග රාජ්‍යයට හිමිකරුවකු වන බව විස්තර කරයි.<br>▪ තම ඥාන මව්පියන් පිළිබඳ තොරතුරු කියයි.<br>▪ ප්‍රසාද ස්නාපනය ලැබීමෙන් ශුද්ධ වූ සභාවේ සාමාජිකයෙක් වන බව ප්‍රකාශ කරයි. | ▪ ප්‍රසාද ස්නාපනය | පියවර 1,2,3,4,5<br>පෙළ පොතේ 9 පාඩම<br>මම දේව දරුවකු වෙමි.<br><br>29 පිටුව ක්‍රියාකාරකම. | 12, 13 | පැය 01 මි.15 |
| | ▪ උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි. | ▪ මරිය මෑණියන් යනු උත්තරීතර ජේසුස් වහන්සේගේ මෑණියන් බව ප්‍රකාශ කරමින් නමෝ මරිය යාච්ඤාව භක්තියෙන් උච්චාරණය කරයි.<br>▪ දේව මෑණියන් තුළ තිබූ යහපත් ගුණාංග නම් කරයි.<br>▪ ජපමාලයක් නිර්මාණය කරයි. | ▪ උත්තරීතර ජේසුස් වහන්සේගේ මව වූ මරිය මෑණියන් හඳුනා ගැනීම. | පියවර 1,2,3<br>පෙළ පොතේ 10 පාඩම<br>සාන්ත මරියනි, දේව මෑණියනි.<br><br>30 පිටුව ක්‍රියාකාරකම | 14, 15 | පැය 01 මි.15 |
| | | | | | මුළු කාලය | පැය 08 මි 45 |

## පළමුවන ශ්‍රේණිය - ක්‍රිස්තියානි ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අද්දකියි. ප්‍රතිප්‍රේමය දක්වයි. | ■ දෙවි පියාණන් වහන්සේගේ ආදරය අද්දැකීමට මග සලසන දෙමව්පියන්, රැකබලාගන්නන්, ගුරුවරුන් වෙනුවෙන් තුති කාඩ් පතක් නිර්මාණය කරයි. | ■ දෙමව්පියන්<br>■ රැකබලාගන්නන්<br>■ ගුරුවරුන් | පියවර 1,2,3<br><br>පෙළ පොතේ 4 වන පාඩම | 5<br><br>5 | පැය 01 මි.15 |
| | | ■ දෙවි පියාණන් වහන්සේගේ ආදරය රැකවරණය දැනෙනට සලසන සහෝදර සහෝදරියන් පිළිබඳ අද්දැකීම් බෙදා ගනියි. | ■ සහෝදර සහෝදරියන් | පියවර 1,2<br><br>පෙළ පොතේ 5 වන පාඩම | 6<br><br>6 | පැය 01 මි.15 |
| | | ■ දෙවි පියාණන් වහන්සේගේ ආදරය රැකවරණය හඳුනා ගැනීමට උපකාර වන හිතමිතුරු චරිත නිර්මාණාත්මක ව නිරූපණය කරයි. | ■ නෑදෑ හිතමිතුරු | පියවර 1,2<br><br>පෙළ පොතේ 6 වන පාඩම | 7<br><br>7 | පැය 01 මි.15 |

## පළමුවන ශ්‍රේණිය - ක්‍රිස්තියානි ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් යහපත් කිතුනු ගුණාංග වඩවා ගනියි. | ■ ආදර්ශවත් කිතුනු දරුවකු ලෙස යහපත් කටයුතුවල නිරත වෙමින් දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වයි. | ■ යහපත් කිතුනු දරුවකුගේ ගුණාංග | පියවර 1,2,3,4<br><br>පෙළ පොතේ 8 වන පාඩම | 9<br><br>9 | පැය 01 මි.15 |
| | ■ ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි. | ■ ජේසු උපතට අදාළ විශේෂ සිදුවීම් හඳුනා ගෙන විස්තර කරයි. | ■ මරියතුමිය ලද දේව පණිවිඩය ශු.ලූක් 1 : 3 | පියවර 1,2,<br><br>පෙළ පොතේ 9 වන පාඩම | 10<br><br>10 | පැය 01 මි.15 |
| | | | ■ ජේසු උපත ශු.ලූක් 2 : 4 - 7 | පියවර 1,2<br><br>පෙළ පොතේ 10 වන පාඩම | 11<br><br>11 | පැය 01 මි.15 |
| | | | ■ එඬේරුන් ශු.ලූක් 2 : 8 - 20 | පියවර 1,2<br><br>පෙළ පොතේ 11 වන පාඩම | 12<br><br>12 | පැය 01 මි.15 |
| | | | | | මුළු කාලය | පැය 08 මි.45 |